විශේෂ මහසභා රැස්වීම් වාර්තාව

ස්ථානය	:-	රඹුක්කන ප්‍රාදේශීය සභාව
දිනය	:-	2026.05.19
වේලාව	:-	පෙ.ව. 09.30

සහභාගිත්වය

ගරු සභාපති ,
1. ආර්.එම්.එස්.එස්.බි.රත්නායක මැතිතුමා

ගරු උපසභාපති ,
2.ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී/මන්ත්‍රිනී,

3. වයි.ජී.ජයවීර මැතිතුමා
4. ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා
5. ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය
6. පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා
7. එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා
8. එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා
9. එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා
10. කේ.සී.සරත් කුමාර මැතිතුමා
11. ජේ.පී.පද්මසිරි මැතිතුමා
12. එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා
13. එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා
14. ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා
15. එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා
16. එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා
17. එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
18. ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා
19. ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
20. පී.ජී.මල්ලිකා මැතිතුමිය
21. ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා
22. එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
23. පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා
24. එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා
25. කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා
26. වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා
27. පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා
28. එච්.ආර්.ප්‍රදිපා රංජනී මැතිතුමිය
29. ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය
30. ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා
31. ඩබ්.ජී.කරුණාවතී මැතිතුමිය

නිලධාරී සහභාගිත්වය

- ආර්.ජී.එස්.නිරෝෂන් මයා - ලේකම්

ආගම සිහිකිරීම

රැස්වීමට පැමිණ සිටි සියලුදෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලද

(අ). සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

01.වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය - අසනීප වීම
02.එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා - අසනීප වීම

ඉදිරිපත් කළ මෙම නිවාඩු ඉල්ලීම් දෙක සම්බන්ධව තමාට ගැටළුවක් ඇති බවත්, තව සුළු වේලාවකින් මෙතුමන්ලා දෙපළ සජීවී සහභාගී වන සමාජ මාධ්‍ය වැඩසටහනක් පවතින බැවින් මෙම නිවාඩු යෝජනා දෙක සම්බන්ධ තීරණයක් ගැනීමට සභාවට ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදී.
සභාවෙන් අදාළ නිවාඩු යෝජනා දෙක අනුමත කිරීමට කිසිවකු ඉදිරිපත් නොවූ බැවින් නිවාඩු යෝජනා ප්‍රතික්ෂේප කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

රටට නිදහස ලබාදී අද දින වනවිට වසර 18 සම්පූර්ණ වන බවත්, කුරිරු යුද්ධයෙන් දිවිය අහිමි වූ හා ආබාධිත වූ රණවිරුවන් ස්මරනය කිරීමට විනාඩියක කාලයක් සභාවක් හැටියට අපට යෙදවීමට නොහැකි වීම ගැන විපක්ෂ මන්ත්‍රීතුමන්ලාගේ කණගාටුව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

මාධ්‍ය ආවරණය අවශ්‍ය බවත්, එතුමන්ලාව දැනුවත් කිරීම සිදු නොකළේ ද යන්න ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මාධ්‍ය දැනුවත් කර ඇති බවත්, එතුමන්ලාගේ සහභාගිත්වය අපට තීරණය කළ නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී.

(ආ). යථාපරිදි කල්දී ඇති යෝජනා

(ආ).01.ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

i. **අංක CLG/LG – 5/3/1 – (iv වෙළුම) හා 2026.01.01 දිනැති ලිපිය පරිදි රඹුක්කන ප්‍රාදේශීය සභාව සතු පොදු වෙළෙඳපළ කඩ කාමරවල ලේඛනගත මුල්බදුකරු විසින් අතුරු බදු දී ඇති කඩ කාමරවල අතුරු බදුකරුවන් නියමානුකූල කිරීම සම්බන්ධයෙන් 2026.03.17 දින පැවති විශේෂ මහ සභා යෝජනා අංක (ආ)01.i යටතේ ගනු ලැබුණු මහ සභා තීරණය පහත පරිදි සංශෝධනය විය යුතු අතර,**

සංශෝධනය විය යුතු අයුරු

"පළාත් පාලන ආයතන සතු ගිවිසුම් මඟින් බදු දී ඇති දේපල ගිවිසුම්ගත බදුකරුවන් විසින් තෙවන පාර්ශවයන් වෙත අතුරු බදු දී ඇති අවස්ථාවක එකී දේපල ටෙන්ඩර් කළ යුතු වුවද,
කඩ කාමර සම්බන්ධව බදු අයිතිය අතුරු බදුකරුවන්ට නියමානුකූල කිරීම මීට පෙර අවස්ථා කිහිපයකදී නීත්‍යානුකූලව පවරා දීම සිදුවී ඇත. එහෙයින් එම සහනය බලාපොරොත්තුවෙන් මෙම කඩ කාමරවල අතුරු බදුකරුවන් බදු අයිතිය ඉල්ලා සිටියි. එහෙයින් එම දේපලේ බදු අයිතිය අවලංගු කර නැවත ටෙන්ඩර් කිරීම ප්‍රායෝගික නොවන බැවින්" යන්න ඇතුලත් කර සභා තීරණය සංශෝධනය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එම්.එන්.මොහමම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

වාර කිහිපයකදීම මේ සම්බන්ධව සාකච්ඡාවට භාජනය කළ බවත්, ලිපිගොනු පරීක්ෂා කළ බවත් ප්‍රකාශ කරන ලදී. අතුරු බදු දීම සම්බන්ධව සභාව විසින් ගත් තීරණය සහකාර කොමසාරිස්තුමා මගින් ගරු ආණ්ඩුකාරතුමන් වෙත යොමු කළ බවත්, කඩකාමර නීත්‍යානුකූලව ටෙන්ඩර් කර යම් පුද්ගලයකු හා ගිවිසුම්ගත වූ පසු ටෙන්ඩර්කරු අදාල දේපළ පරිහරණය කළ යුතු වුවද ටෙන්ඩර්කරු විසින් එම දේපළ

නැවත වෙනත් පුද්ගලයකුට පැවරීමක් කිරීමේ හැකියාවක් නීතිමය වශයෙන් නොමැති බවත්, ටෙන්ඩර්කරුට දේපළ සම්බන්ධ එවැනි තීරණ ගත නොහැකි බවත්, දේපළ ඔහුට අවශ්‍ය නොවන්නේ නම් නැවත සභාවට පැවරීම කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී. නමුත් ලිපි ගොනු පරීක්ෂා කිරීමේදී දැකගත හැකි වූයේ යම් පුද්ගලයකු විසින් අදාළ කඩ කාමර ටෙන්ඩර් ලබාගෙන ඔහු විසින් එම කඩකාමර වෙනත් කෙනෙකුට බදු දී ඇති බවත්ය. වර්තමානයේ ව්‍යාපාර සිදු කරනු ලබන පුද්ගලයින් විසින් ආණ්ඩුකාර තුමියගෙන් කළ ඉල්ලීමකට පිළිතුරක් ලෙස මාර්තු 31 දක්වා අතුරු බදු ලබාගෙන ඇති පුද්ගලයින්ට නීත්‍යානුකූල වීමට සහන කාලයක් ලබාදී ඇති බවත්, ඔවුන්ගේ නීත්‍යානුකූල භාවය සම්බන්ධ සාක්ෂි සහිතව ඔප්පු කිරීමට අවශ්‍ය ලියවිලි සමඟ වසර 30 උපරිම කාලයකට යටත්ව බදු දීමට අවස්ථාව ලබාදීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව ඊට අදාළ ලියවිලි ඉදිරිපත් කළ ද එහිදී මෙම කඩකාමර නැවත ටෙන්ඩර් නොකිරීම ගැටළු සහගත බව සභාව දැනුවත් කර ලිපියක් එවා ඇති බව ප්‍රකාශ කරන ලදී.

මෙම කඩ ටෙන්ඩර් කිරීමකට යාම ප්‍රායෝගිකව ගැටළු සහගත බවත්, මන්දයත් දීර්ඝ කාලීන ව්‍යාපාරික කටයුතු පවතින බවත්, නැවත ටෙන්ඩර් කළ විට ඔවුන්ගේ ව්‍යාපාරික අවකාශය බිඳ වැටීමේ අවධානම පවතින බැවින් බවත්, ආණ්ඩුකාර අනුමැතිය සඳහා 2026.03.17 දින පැවති විශේෂ මහසභා යෝජනා අංක (ආ) 01.i යටතේ ගනු ලැබූ තීරණයට ඉහත සංශෝධනය ඇතුළත් කිරීම සුදුදු ද නැද්ද යන්න තීරණය කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මීට පෙර පැවැති විශේෂ මහසභාවේදී මෙම කඩකාමර අතුරු බදු දීම සම්බන්ධව සාකච්ඡා කළ බවත්, එහිදී 25 % මුදලක් අය කරගෙන අතුරුබදුකරුට එම දේපළ බදු දීමට එකඟතාව ලබා දුන් බවත්, සභාව විසින් ගන්නා ලද තීරණ උත්තරීතර තීරණ බවත්, ආණ්ඩුකාරතුමිය විසින් එවා ඇති ලිපියෙහි පරස්පරතාවක් පවතින බවත්, කඩකාමර සම්බන්ධව නීතිය අකුරට කිරීමට නොහැකි බවත්, එදා විශේෂ සභාවේදී අතුරු බදු ලබාගෙන ඇති පුද්ගලයින්ටම එම කඩකාමර 25 % පෙර ගෙවුම් මුදලක් ලබාගෙන පවරාදීම සම්බන්ධව සභාව තීරණය කළ බවත්, නමුත් ආණ්ඩුකාරතුමිය විසින් නැවත එම කඩ ටෙන්ඩර් කිරීම සිදුකළ යුතු බව දන්වා ඇති බවත්, එසේ මෙම කඩකාමර ටෙන්ඩර් කිරීමකට යාම සභාවක් හැටියට හා සභාපතිතුමන් හැටියට ඔබතුමන්ගේ එදා ගත් තීරණයෙහි ගරුත්වයට අහිතකර බලපෑම් ඇතිවිය හැකි බව තමාට හැඟෙන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ටෙන්ඩර් කිරීම ප්‍රායෝගික නොවන බව 2026.03.17 දින විශේෂ මහසභාවේ ගන්නා ලද තීරණයට ඇතුළත් විය යුතු බවත්, ඒ සඳහා මෙම විශේෂ සභාව කැඳවා සභා තීරණය සංශෝධනය කිරීමේ යෝජනාව ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

නීතියෙන් පුනපුනා ප්‍රකාශ කරනවා නම් ටෙන්ඩර් කිරීම සුදුසු බව සභාවක් හැටියට අප එසේ නොකිරීමෙන් අධිභාරයක් පැන නැගිය හැකි බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/LG – 5/3/1 (vi වෙළුම) හා 2026.05.07 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.ඒ අනුව නැවත ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය නොකිරීමට හේතුව විමසා ඇති බවත්, එසේ ටෙන්ඩර් කිරීම ප්‍රායෝගික නොවන බවට සභාව විසින් ගන්නා ලද තීරණ අවශ්‍ය බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. 2026.03.17 දින ලබාදුන් තීන්දුවේ අඩුපාඩුවක් පෙන්වා දී ඇති බැවින් එම අඩුපාඩුව නිවැරදි කර ගත යුතුව පවතින බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

2026.03.17 දින පැවැති විශේෂ මහසභා යෝජනා අංක (ආ).01.i යටතේ ගනු ලැබුණු මහසභා තීරණය සංශෝධනය විය යුතු බව දන්වා ඇති බවත්, අද දින විශේෂ සභාවක් ඇඳවා ඇත්තේ එදා ගන්නා ලද තීරණය

සංශෝධනය කිරීමට සිදුවී ඇති බැවින් බවත්, එදා ගත් තීරණය ඉහත පරිදි සංශෝධනය කිරීමට මහසභා අනුමැතිය ලබාදීම පිළිබඳව අදහස් ලබාදීම සිදුකිරීම ප්‍රමාණවත් බවත්, නැවත නැවත තර්ක ඉදිරිපත් කිරීම ඵල රහිත බවත්, මෙම කඩ කාමර අතුරු බදුකරුවන්ට බදු දීම සම්බන්ධ තීන්දු තීරණ 2026.03.17 දින ලබාගෙන ඒ සම්බන්ධ ලිපිලේඛන ගරු ආණ්ඩුකාරතුමිය වෙත ඉදිරිපත් කළ බවත්, එහිදී සභාව ගත් තීරණයේ පවතින අඩුපාඩුව සඳහන් කර නැවත එම සභා තීරණය සංශෝධනය කර එවන ලෙස දන්වා ඇති බවත්, විෂය නිලධාරීතුමිය සමඟ මේ සම්බන්ධව තමා පෞද්ගලිකවම කථා කර ලිපිය අධ්‍යයනය කළ බවත්, එහිදී විෂය නිලධාරී ප්‍රකාශ කළ පරිදි 2026.03.17 දින සභාව විසින් ගන්නා ලද තීරණය සභාගත කිරීමේදී සිදුවූ දෝෂයක් නැවත එම ලිපි හරවා ඒවා ඇති බව ප්‍රකාශ කළ බවත්, ඒ අනුව එදින ගත් සභා තීරණය මෙහි දක්වා ඇති වගන්තිය පරිදි සංශෝධනය කිරීම සුදුසු බවත්, මේ සම්බන්ධව නැවත තර්ක ඉදිරිපත් කිරීමත් අවශ්‍ය නොවන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා දැක්වූ අදහස්ට, අදහසක් ඉදිරිපත් කළ යුතු බවත්, ලබාගත යුතු 25% පෙර ගෙවුම් මුදල පිළිබඳව තීරණය කිරීමේදී පෙර ගෙවුම් මුදලින් 25% වටිනාකම හා නව මාසික තක්සේරු වටිනාකම මෙන් වසර 10 ක අගයෙන් 25% වටිනාකම යන අගයන් දෙකෙන් වැඩි අගය ලබාගත් බවත්,

1. 2026.04.28 දින පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා එවන ලද ලිපි සභාගත කරන ලදී. ඒ අනුව 2026.03.17 දින අප විසින් ගන්නා ලද එම වැඩි අගය පෙර ගෙවුම් මුදල ලෙස ලබා ගැනීම සම්බන්ධව විගණනයක් සිදු නොවන බවත්,2026.03.17 දින ගත් තීරණයෙහි පවතින දුර්වලතාවය ලෙස ඉහත යෝජනාවේ සඳහන් වගන්තිය පරිදි ටෙන්ඩර් කිරීම ප්‍රායෝගික නොවන බව සඳහන් නොවීම බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

අතුරු බදු නියමානුකූල කිරීම සඳහා ලබා දුන් සහන කාලය 2026 මාර්තු 31 න් අවසන් නම් අතුරු බදු දීම සම්බන්ධව කිසියම් ගැටළුවක් මතුවුවහොත් සියලුම මන්ත්‍රීවරුන් එහි වගකීම භාර ගත යුතු වන බවත්, මහජන නියෝජිතයින් වශයෙන් අප සැමවොම නිලධාරීන් කියන කියන විදිහට කටයුතු කළ යුතු නොවන බව ප්‍රකාශ කරන ලදී. තවද, නිවාඩුවක් සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත් විට එය සම්පූර්ණ බවත්, නමුත් ඒ සඳහා වෛද්‍ය වාර්තා ඉදිරිපත් කිරීමක් අවශ්‍ය නොවන බවත්, මහජන නියෝජිතයින්ට ලැබිය යුතු නිසි තැන ලබාදීමට නිලධාරීන් පසුබට වනවානම් නිලධාරීන් විසින් මහජන නියෝජිතයින් පාලනය කිරීම සිදුවනවා නම් කොහෙමත් යන කුණු ඇගේ ගා ගැනීමේ අවශ්‍යතාවයක් නොමැති බව ප්‍රකාශ කරන ලදී. තවද,

1. අවසාන දිනය මාර්තු 31 නම් එම දිනය දීර්ඝ කිරීමක් වනවාද නැද්ද යන්න දැනගත යුතු බවත් ,
2. මහජන නියෝජිතයින් වශයෙන් අපට ගරුත්වයක් තිබිය යුතු බවත්, එය කෙලෙසාගත යුතු නොමැති බවත්,
3. ටෙන්ඩර් කිරීම පුන පුනා ප්‍රකාශ කරනවා නම් ටෙන්ඩර් කිරීම සිදුකිරීම සිදු සුදුසු බවත්,
4. මෙම කඩ කාමර ටෙන්ඩර් නොකරන බවට සභාව තීන්දුවක් ගත යුතු බවත්, ප්‍රකාශ කරන ලදී. එසේම ආණ්ඩුවක් විසින් තීන්දු තීරණ ගන්නවා නම් ආණ්ඩුව විසින්ම ඊට අදාළ වගකීම බාරගත යුතු බවත්, විපක්ෂය මේ කටයුත්තෙන් නිදහස් කරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

යම් ගැටළුවක් විසඳා ගැනීමට යාමේදී ඒ සම්බන්ධව යම් සහන කාලයක් ලබා දෙන බවත්, එහිදී එම කාරණය ඉටු කරගත නොහැකි වුවහොත් නැවතත් සහන කාලය ලබාදීම පොදු කාරණයක් බවත්, තමා මූලාසනයේ සිටින තාක්කල් තමා විසින් ගනු ලබන තීන්දු තීරණවල වගකීම තමා භාරගන්නා බවත්, එදත් එය පැවසූ බවත්, මින් ඉදිරියටත් එය එසේම බවත්, කිසිම මහජන නියෝජිතයකු තනි නොකරන බවත් ප්‍රකාශ කරන ලදී.

නිලධාරින් විසින් මහජන නියෝජිතයින් පාලනය කිරීමට ලක්වීමක් සිදු නොවන බවත්, සභාවක සිටින සභාපති ඇතුළු මන්ත්‍රී මණ්ඩලය යම් නීති රාමුවකට යටත්ව කටයුතු කළ යුතු බවත්, අපහට මහවිශාල බලයක් ලබාදී නොමැති බවත්, ජනාධිපතිතුමන්ටත් කටයුතු කිරීමේදී යම් නීති රාමුවක් පවතින බවත්, අපි කවුරුත් රටේ පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුගතව කටයුතු කළ යුතු බවත්, නීතිය සැමට ඉහළින් පවතින බවත්, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සිටිය යුතු බවත්, ඔවුන්ට රජයේ නිලධාරීන් ලෙස නම් කර ඇති බවත්, ඔවුන් විසින් අපව දැනුවත් කිරීම් කරන්නේ ඔවුන්ගේ අදහස් නොවන බවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව බවත් ප්‍රකාශ කරන ලදී.
මෙම කඩ කාමර සම්බන්ධව අදාළ ලේඛන පරීක්ෂා කිරීමේ හැකියාව පවතින බවත්, අදාළ තීන්දුව ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම ඉතා වටිනා බවත් ප්‍රකාශ කරන ලදී. තවද, මෙම සංශෝධන වගන්තිය අනුමත කිරීමේ හෝ නොකිරීමේ බලය ඔබතුමන්ලා සතු බවත්, නිෂ්ප්‍රභා කළහොත් අතුරු බදුකරුවන්ගේ ගිවිසුම් අවලංගු කර එම කඩ කාමර නැවත ටෙන්ඩර් කිරිමේ හැකියාවක් පවතින බවත්, ඊට අදාළ ක්‍රියාමාර්ග තමාට ගැනීමට සිදුවන බවත්, එවිට උද්ගත වන ගැටළුවලට මහජන නියෝජිතයින් වන ඔබතුමන්ලා මුහුණ දෙන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**
2026.03.17 දීර්ඝ කාලීනව සාකච්ඡා කර තීරණයක් ලබාගත් බවත්,එදින ලබාදුන් තීරණයට යෝජනාවේ සඳහන් සංශෝධන වගන්ති ඇතුළත් කිරීම සම්බන්ධව එකඟතාවය පමණක් අවශ්‍ය බවත්, මේ සම්බන්ධව බෙදීමකට යාමේ අවශ්‍යතාවක් නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
බෙදීමකට යාමේ අවශ්‍යතාවයක් පවතී ද යන්න විමසන ලදී.එවැනි අවශ්‍යතාවයක් පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -
2026.03.04 දින පැවති මාසික මහසභා රැස්වීමේදී කල් තබන,2026.03.17 දින පැවැති විශේෂ මහසභා රැස්වීමේදී සාකච්ඡාවට භාජනය වූ (ඊ).01.I.xi යෝජනාවේ ගනු ලැබූ සියලුම තීරණ වලට,
"පළාත් පාලන ආයතන සතු ගිවිසුම් මගින් බදු දී ඇති දේපළ ගිවිසුම්ගත බදුකරුවන් විසින් තෙවන පාර්ශ්වයන් වෙත අතුරු බදු දී ඇති අවස්ථාවක එකී දේපළ ටෙන්ඩර් කළ යුතු වුවද, කඩ කාමර සම්බන්ධව බදු අයිතිය අතුරු බදුකරුවන්ට නිමානුකූල කිරීම මීට පෙර අවස්ථා කිහිපයකදී නීත්‍යානුකූලව පවරා දීම සිදු වී ඇත. එහෙයින් එම සහනය බලාපොරොත්තුවෙන් මෙම කඩ කාමරවල අතුරු බදුකරුවන් බදු අයිතිය ඉල්ලා සිටියි. එහෙයින් එම දේපලේ බදු අයිතිය අවලංගු කර නැවත ටෙන්ඩර් කිරීම ප්‍රායෝගි නොවන බැවින්" යන්න ඇතුළත් කර එම විශේෂ මහසභා තීරණය සංශෝධනය කිරීමට අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ii. 2026 වෙසක් උත්සවය නිමිත්තෙන් ඉඹුල්ගස්දෙණිය මහජන පුස්තකාලය හා පාඨක සමාජය එක්ව භක්ති ගීත වැඩ සටහනක් 2026.05.31 සවස පුස්තකාල පරිශ්‍රයේදී පැවැත්වීමට තීරණය කර ඇති අතර, ඒ සඳහා ඇස්තමේන්තු වියදම වන රු.35,000.00 සඳහා ප්‍රතිපාදන වෙන්කර ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
බෙදීමකට යාමේ අවශ්‍යතාවයක් පවතී ද යන්න විමසන ලදී.එවැනි අවශ්‍යතාවයක් පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.
තීරණය -
2026 වෙසක් උත්සවය නිමිත්තෙන් ගීත වැඩසටහන වෙනුවෙන් ඇස්තමේන්තු ගත වියදම වන රු.35,000.00 සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට වන යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

iii. **ශ්‍රී සම්බුද්ධ තෙමඟුල සිහිකරමින් 2026.05.27 සිට ජූනි 02 දක්වා යෙදෙන වෙසක් සතිය නිමිති කරගෙන,**

- **2026.05.27 - ඇස් දන් දීම හා ශරීර කොටස් දන් දීම සඳහා ලියාපදිංචි කිරීමේ වැඩ සටහන,**
- **සුජාතා විදුහලේ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන,**
- **2026.05.30 - අශෝක බෝධිරාජාරාමයේදී භක්ති ගීත වැඩ සටහන,**
- **2026.06.02 - රඹුක්කන ප්‍රාදේශීය සභා භූමිය හා පොළ භූමියේ ශ්‍රමදාන වැඩසටහන්,**

ඉහත ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩ සටහන් පිළිබඳ මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

සභා අරමුදල් වැය නොවන බැවින් මූල්‍යමය වටිනාකමක් නොමැති යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

රාජ්‍ය උත්සව රාජ්‍ය වැඩසටහන් පිළිබඳ විස්තරය රජයන් විසින් දිස්ත්‍රික්ක මට්ටමින්, ප්‍රාදේශීය මට්ටමින් එවන බවත්, එහිදී සභාවට පැවරෙන වැඩ කොටසක් පවතින බවත්, එම වැඩ සටහන තමාගේ බලතල උපයෝගී කරගෙන සිදුකළ හැකි බවත්, නමුත් ප්‍රාදේශීය සභාවේ නම උපයෝගි කරගෙන මෙවැනි වැඩසටහනක් සිදු කිරීම සම්බන්ධව ඔබතුමන්ලාගෙන් කැමැත්ත අකමැත්ත විමසීම කළ යුතු නොවේද යන්න විමසන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

අදාළ වැඩසටහන සම්බන්ධව යම් මුදලක් වැය වේ නම් එම මුදල සභා අරමුදලින් දැරීමට අදහස් කරයි නම් එවැනි වැඩසටහන් සඳහා අපේක්ෂිත වියදම දක්වා න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවත්, මෙවැනි වියදම් දැරීමට සිදු නොවන වැඩසටහන් න්‍යාය පත්‍රයට ඇතුළත් නොකර වාචිකව ප්‍රකාශ කිරීම ප්‍රමාණවත් බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2026.05.27 සිට ජූනි 02 දක්වා යෙදෙන වෙසක් සතිය නිමිත්තෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් මාලාව වන

- 2026.05.27 - ඇස් දන් දීම හා ශරීර කොටස් දන් දීම සඳහා ලියාපදිංචි කිරීමේ වැඩ සටහන,
- සුජාතා විදුහලේ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන,
- 2026.05.30 - අශෝක බෝධිරාජාරාමයේදී භක්ති ගීත වැඩ සටහන,
- 2026.06.02 - රඹුක්කන ප්‍රාදේශීය සභා භූමිය හා පොළ භූමියේ ශ්‍රමදාන වැඩසටහන්,

සභාවට ඉදිරිපත් කළ අතර එම යෝජනාව සභාගත කිරීම සම්බන්ධ බෙදීමක අවශ්‍යතාව පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවයක් පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -

2026 වර්ෂයේ වෙසක් සතිය නිමිත්තෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිත පහත වැඩසටහන් සඳහා මහසභා අනුමැතිය ලබා ගැනීමට වන යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

- 2026.05.27 - ඇස් දන් දීම හා ශරීර කොටස් දන් දීම සඳහා ලියාපදිංචි කිරීමේ වැඩ සටහන,
- සුජාතා විදුහලේ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන,
- 2026.05.30 - අශෝක බෝධිරාජාරාමයේදී භක්ති ගීත වැඩ සටහන,

- 2026.06.02 - රඹුක්කන ප්‍රාදේශීය සභා භූමිය හා පොළ භූමියේ ශ්‍රමදාන වැඩසටහන්,

iv. **2026 වර්ෂයේ සභා අරමුදල් යොදවා ක්‍රියාත්මක කිරීමට ඇස්තමේන්තු සකස් කළ රඹුක්කන ප්‍රාදේශීය සභා බාහිර බිත්ති තීන්ත ආලේප කිරීම සඳහා වන ඇස්තමේන්තුව 2026 වර්ෂයේ නව මිල (Rate) ඇතුලත් කර නැවත සකස් කර ඇත. එහි වටිනාකම වන රු.5,260,000.00ක ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

මෙම යෝජනාවට මීට පෙර ලක්ෂ 34 වැනි මුදලක් වෙන්වෙලා තිබුණු බවත්, මේ වන විට මැද පෙරදිග පවතින යුධමය තත්ත්වය නිසා තෙල් මිලයෙහි උච්චාවචනය හේතුවෙන් 2026 වර්ෂයේ මිල ගණන් (Rate) වෙනස් වී ඇති බවත්, මෙම යෝජනාව ඉවත් කිරීමට නොහැකි අත්‍යවශ්‍ය යෝජනාවක් වුවද පසුව සලකා බැලීමට මෙම යෝජනාව තැබීම සුදුසු බව යෝජනා කරන ලදී.

තවද, දිට්වා සුළි කුණාටුව වැනි ස්වභාවික විපත් නිසා ඇති වී ඇති විවිධ බලපෑම් නිසා මේ වන විට බස් නැවතුම්පොළ අසල වැසිකිළි වල මේ වන විටත් පිටාර යමින් තිබෙන බවත්, එවැනි දේ පිළිසකර කිරීම සඳහා මෙම මුදල යෙදවීම් සුදුසු බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ප්‍රාදේශීය සභා මන්ත්‍රි එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා සංශෝධන යෝජනාවක් ඉදිරිපත් කිරීමට කැමැත්ත විමසා ඇති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

2025 වසරේ දිට්වා සුළිකුණාටුවෙන් අප බල ප්‍රදේශය තුළ කැඩී ගොස් ඇති ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට මෙම මුදල් වෙන් කිරීම සුදුසු බව යෝජනා කරමි. (සංශෝධිත යෝජනාව)

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

එම යෝජනාව තමා ස්ථිර කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

දිට්වා සුළි කුණාටුවෙන් සිදුවී ආපදා තත්ත්වයන් සංවර්ධනය කිරීම සඳහා විවිධ ආකාරයෙන් ප්‍රතිපාදන ලැබෙමින් පවතින බවත්, මිලියන 117 ක් රඹුක්කන ආසනයට හිමි වී ඇති බවත්, එම මුදල් දිට්වා නිසා හානියට පත් මාර්ග හා අනෙකුත් දෑ පිළිසකර කිරීමට යෙදවිය යුතු බවත්, දැනට පළමු අදියර යටතේ මිලියන 32 ක් ලැබී ඇති බවත්, ඊට අදාළ ව්‍යාපෘතින්ට ඇස්තමේන්තු සකස් කරමින් පවතින බවත් ප්‍රකාශ කරන ලදී.

මෙම යෝජනාවට අදාළ මුදල් වෙන් කර ගෙන පවතින්නේ සභා අරමුදලින් බවත්, සභාව ආරම්භ කරන මොහොතේදී මුහුණ දුන් පරවි කුරුල්ලන්ගේ ප්‍රශ්නයත් සමඟ මෙම යෝජනාව සභාවට ඉදිරිපත් වූ බවත්, මෙය නොකිරීම සම්බන්ධව විගණනය විසින් ප්‍රශ්න කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. තවද , සිවිලිම දිරාපත් වී ඇති බැවින් හා එහි පවතින අඩුපාඩු මත මෙම පරවි ප්‍රශ්නය මතුවී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. විශේෂයෙන්ම සභා රැස්වීම පවතින මේ මොහොතේ මෙම ස්ථානය මෙසේ පිරිසිදුව පැවතීයද හෙට දින පැමිණ තත්ත්වය ඔබතුමාලාට බැලූ විට මෙම යෝජනාව ක්‍රියාත්මක කළ යුතුද නැතිද යන්න තීරණය කළ හැකි බව ප්‍රකාශ කරන ලදී.

තවද, ගිය වර්ෂයේදී (2025) මෙම ව්‍යාපෘතිය ටෙන්ඩර් කර ගැනීමට නොහැකි වූ බවත්, ගිය වසරේ දී ඇස්තමේන්තු ගත මුදල ලක්ෂ 45 ක් වැනි මුදලක් වූ බවත්, වෙළඳපොළ මිල වෙනස් වීමත් මත 2026 නව මිල (Rate) ඇතුළත් කිරීමට සිදුවීම මත එහි වටිනාකම ලක්ෂ 52 පමණ වූ බවත් පැහැදිලි කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

මෙම යෝජනාව තීන්ත ආලේප කිරීම ලෙස පැවතීම මත අනෙකුත් වැඩ කොටස් පිළිබඳ සමාජයට ඉස්මතු වී පෙනෙන බවත්, මෙම යෝජනාවේ අත්‍යවශ්‍යම වැඩ කොටස් ටික තෝරාගෙන එම කොටස් ටික පමණක්

කිරීම සුදුසු බවත්, එවිට යෝජනාව තීන්ත ආලේප කිරීම ලෙස නොයෙදවා අලුත්වැඩියා ලෙස යෙදිය හැකි බවත් ප්‍රකාශ කරන ලදි. තවද, රටේ පවතින ගැටළුකාරී තත්ත්වය හමුවේ රඹුක්කන ප්‍රාදේශීය සභාව සහා ගොඩනැගිල්ලෙහි තීන්ත ආලේප කිරීම සඳහා රු.ලක්ෂ 52 ක් වැය කර ඇති බව සමාජගත වන බැවින් යෝජනාව සංශෝධනය කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

උප සභාපතිතුමන් මෙම විෂය සම්බන්ධ දැනුම ඇති පුද්ගලයකු ද වී මෙසේ අදහස් දැක්වීම් පිළිබඳ කණගාටුව ප්‍රකාශ කරන බවත්, සිවිලිම සැකසීම බිම සිට සිදුකළ හැකි වුවත් සහා ගොඩනැගිල්ලේ මහල් කිහිපයක් ඇති බවත්, මෙම ව්‍යාපෘතියේ විශාල වියදමක් දරා ඇත්තේ පලංචි සඳහා බවත්, සිවිලිම සකස් කිරීමට යොදන පලංචියම උපයෝගී කරගෙන බාහිර බිත්තියේ තීන්තා ආලේප කිරීම සුදුසු බැවින් එයද මෙම ව්‍යාපෘතියට යෙදූ බවත් ,යම් ව්‍යාපෘතියකට අදාළව මාතෘකාවක් යෙදීමේදී එහි පවතින එක් කොටසක් හෝ දෙකක් පමණක් යොදවන බවත්, මෙම ව්‍යාපෘතියට ආදාළ ලිපිගොනු පරීක්ෂා කිරීමට හැකියාව පවතින බවත් ,උපසභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කිරීම සුදුසු බවත්, ලබන සභා වාරය වන විට නිවැරදි තොරතුරක් සමග කළ යුතු වැඩ අයිතම සමහ ඒ සඳහා ඇස්තමේන්තුගත වටිනාකමත් ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී. ඒ අනුව උපසභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කරන ලදී.

කමිටු සාමාජිකයින්,
01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා (කාර්මික කමිටු සභාපති)
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

මේ සඳහා කමිටුවක් පත් කිරීමට අවශ්‍ය නොවන බවත්, අදාළ යෝජනාව වෙනස් කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ආණ්ඩු පක්ෂයේ යෝජනාවකට උප සභාපතිතුමන් විරුද්ධත්වය ප්‍රකාශ කිරීම සම්බන්ධව තමා පුදුමයට පත් වූ බවත්,නමුත් මෙම යෝජනාව ක්‍රියාත්මක කළ යුතු යෝජනාවක් බවත්, මේ මොහොතේ දී පවා මෙම පරිශ්‍රය පුරා පරවී පිහාටු පාවෙන බවත්, නිලධාරීන්ට දෛනිකව රාජකාරී කරගැනීමේ දී ගැටළු ඇතිවී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.
තවද, වැඩ විෂයක නමෙහි ගැටළු ඇති වුවද වැඩ විෂය ඇතුළත විවිධ වූ කාර්යයන් පැවතිය හැකි බවත්, මෙම යෝජනාවේද අන්තර්ගතය තුළ විවිධ වූ වැඩ කොටස් තිබිය හැකි බවත්, හැකි ඉක්මනින් මෙම යෝජනාව ක්‍රියාත්මක කළ හැකි නම් වටිනා බවත්, සභා ගර්භයේ පවතින අපිළිවෙලට විසඳුමක් ලෙස සභා ගර්භය සැකසීමේ යෝජනාවක් ද පවතින බැවින් එම යෝජනාවන් ක්‍රියාවට නැංවීමට හැකි නම් එය අගය කරන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

මෙම යෝජනාව ඉතා වටිනා බවත්, මෙම ඉතා විශාල මුදලක් බැවින් දිස්ත්‍රික් ඉංජිනේරු වෙත යොමු කර එහි අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත් , සභා ගොඩනැගිල්ලෙහි පිටුපස පවතින වැසිකිළි වලවල් සකස් කිරීමට හැකියාව පවතී නම් වටිනා බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

උපසභාපතිතුමන් කී පරිදි තීන්ත ආලේප කිරීමට මේතරම් විශාල මුදලක් වැය කිරීම නිශ්ඵල බවත්, සභාපතිතුමන් ප්‍රකාශ කරන පරිදි පරවි ගැටළුව නිසා සිවිලිම සකස් කිරීමට වෙනම ඇස්තමේන්තුවක් සකස් කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.තවද,සභා ගර්භය අසල පවතින මෙම ගවමස් කඩය යන පුවරුව සභා ගර්භයට කොකරම් වටිනාකමක් එක්කර ඇද්ද යන්නත්, සභිකවරුන් වන අප සැම ගවයෝද යන්නත් විමසන ලදී. එසේම මෙම යෝජනාවේ සඳහන් පරිදි තීන්ත ආලේපය සඳහා පමණක් අනුමැතිය ලැබෙන

බවත්, සිවිලීම සකස් කිරීම පරවී ගැටළුව විසඳීම ආදිය සම්බන්ධව යෝජනාවේ සඳහන් නොවන බැවින් අනුමැතියක් හිමි නොවන බවත් ප්‍රකාශ කරන ලදී. තවද, නගරයෙහි පවතින වෙළඳ සංකීර්ණවලද මෙම පරවි ප්‍රශ්නය පවතින බවත්, ඒවාද සකස් කිරීමේ වගකීම සභාව සතු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

මෙම යෝජනාව බාහිර සමාජයට ගිය විට ඔවුන් ව්‍යාපෘතියෙහි ඇති අන්තර්ගතය ගැන නොදැන සභාවේ බාහිර බිත්ති තීන්ත ආලේප කිරීමට මෙතරම් විශාල මුදලක් වැය කිරීම සම්බන්ධව වැරදි අර්ථකථනයක් ලබාගත හැකි බවත්, එනම් මෙවැනි ව්‍යසනකාරී මොහොතක රඹුක්කන ප්‍රාදේශීය සභාව මෙතරම් විශාල මුදලක් වැයකර සභා ගොඩනැගිල්ලෙහි තීන්ත ආලේප කර ඇත යන්න සමාජගත විය හැකි බවත් ප්‍රකාශ කළ අතර ඊට විසඳුම් ලෙස,

01. මෙම යෝජනාව අලුත් වැඩියා කිරීම ලෙස සංශෝධනය කළ යුතුයි.
02. තීන්ත ආලේප කිරීම ලෙසම යෝජනාව පවතී නම් යෝජනාව කල් දැමීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

සභාගර්භයේ සෝෂා

සභාපතිතුමන් විසින් එය සමථයකට පත්කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව ඉල්ලා අස්කර ගන්නා බව ප්‍රකාශ කරන ලදී. තවද, මෙම පරවී ගැටළුව සම්බන්ධව පවතින විගණන විමසුමට පිළිතුරු ලෙස රඹුක්කන මහසභාවේ ගරු මන්ත්‍රීමණ්ඩලය මීට අදාළව ගෙන එන ලද යෝජනාව ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා නොදුන් බැවින් පරවි ගැටලුවට විසඳුමක් ලබාදීමට අපොහොසත් වූ බව දන්වා යැවීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

සභාගර්භයේ සෝෂා

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මීට පෙර පැවැති සභා වාරයකදී (2026.02.03) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමන් විසින් මෙම යෝජනාව සම්බන්ධව වාචික ප්‍රශ්න කිරීමත් සිදුකළ බවත්, ඊට තමා පිළිතුරු ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී.
තවද , 2026 වර්ෂයේ නව මිල ගණන් (Rate) යටතේ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී එම වෙන් කළ මුදලින් සිදු කළ නොහැකි බැවින් නැවත ඇස්තමේන්තුව සකස් කළ බව ප්‍රකාශ කරන ලදී. තවද, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා මතු කළ ප්‍රශ්නය පරිදි මිලියන 3 ට වැඩි (ලක්ෂ 30 ට වැඩි) ඇස්තමේන්තු පළාත් පාලන ඉංජිනේරුතුමාගේ අනුමැතියට ඉදිරිපත් කළ යුතු බවත්, එතුමාගේ අනුමැතිය ලැබුණු පසුව සභා අනුමැතියට ඉදිරිපත් කළ බවත්, ඇස්තමේන්තු සම්බන්ධ නීත්‍යානුකූල අවශ්‍යතා සපුරා ඇති බවත්, එසේ නොමැතිව මෙම ව්‍යාපෘතිය සභා අනුමැතියට නොදැමූ බවත් ප්‍රකාශ කරන ලදී. මෙම යෝජනාවේ පහත අයිතම වන
01 පවතින සිවිලිම ඉවත් කිරීම
02.එය ඇලුමිනියම් බෙඩ් දමා සවිකිරීම
03.ඩවුන්පයිප්ප දැමූ බොක්ස් ටික සකස් කිරීම.
04.ගොඩනැගිල්ලේහි බාහිර බිත්තිවල තීන්ත ආලේපය.
05.පලංචි දැමීම හා සේෆ්ටි නෙස්ට් (ආරක්ෂිත දැළ දැමීම)
ඇතුළත් බවත්, 05 වන අයිතමය සම්බන්ධව කොන්ත්‍රාත්කරුට අප විසින් දැනුවත් කිරීමක් කළ යුතු බවත්, එය කොන්ත්‍රාත් නීතිය බවත්, අපේ ආරක්ෂාව පිළිබඳව කොන්ත්‍රාත්තුව ලබාදීමට ප්‍රථම දැනුවත් නොකළහොත් එය සභාවේ වරදක් බවත්, එවිට ඒ සඳහා අප වගකීමට බැඳෙන බවත්, දන්වා පළාත් පාලන

ඉංජිනේරුතුමන් විසින් දන්වා එවා ඇති බවත්, එය නිවැරදි කිරීම සිදුකළ බවත් ප්‍රකාශ කරන ලදී. මෙම යෝජනාවට අදාළ ඇස්තමේන්තුවේ මාතෘකාව ලෙස Estimate for the Panting of external wall and preparing eave ceiling at pradesiya Sabha Bildding බවත්, සභාවට යෝජනාව ඉදිරිපත් කිරීමේ පහසුවට විෂය නිලධාරී විසින් ප්‍රාදේශීය සභා ගොඩනැඟිල්ලේහි බාහිර බිත්ති තීන්ත ආලේප කිරීම ලෙස යොදා ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

සභාගර්භයේ ඝෝෂා

සභාපතිතුමන් විසින් එය සමථයකට පත්කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

2025 වර්ෂයේ පැවති මිල ගණන් (Rate) යටතේ මෙම ඇස්තමේන්තුව සකස් කර ඇති බවත්,2026 වර්ෂයේ මිල ගණන් (Rate) විශාල ලෙස ඉහළ යාම හේතුවෙන් එම මිල ගණන් (Rate) පදනම්ව නැවත ඇස්තමේන්තුව සකස් කිරීමට සිදු කළ යුතු බවත්, එම සංශෝධිත ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කිරීමේදී එම යෝජනාව වෙනස් කර ඉදිරිපත් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

සභාගර්භයේ ඝෝෂා

සභාපතිතුමන් විසින් එය සමථයකට පත්කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

රටේ පවතින ආර්ථික තත්ත්වයන් සලකා බලා උපසභාපතිතුමන්ගේ අදහසට තමා එකඟ බවත්, විශේෂයෙන්ම සභා පරිශ්‍රය ඉදිරිපස තිබූ පොකුණ කඩා ඉවත් කර එහි වාහන නැවතීමේ අංගනයක් ඉදිකර තිබුණද මේ මොහොත වෙන විටත් එහි කිසිදු වාහනයක් නවතා නොමැති බවත්, මහජනතාවගේ මුදල් අනවශ්‍ය ලෙස අපතේ නොයවන ලෙස ඉල්ලා සිටින ලදී. උපසභාපතිතුමන්ගේ අදහස අනුව සමාජය වෙත මෙම යෝජනාව ගිය විට සභාව ගැන මහජනතාවගේ හිතේ ඇති වන ප්‍රතිරූපය නැවත සකස් කළ නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී. තවද, මෙම ව්‍යාපෘතිය කිරීමට ඉක්මන් නොවී කල් දැමීම සුදුසු බවත්, පරවී ප්‍රශ්නය විසඳීමට වෙනම ඇස්තමේන්තුවක් සකස් කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

මෙම යෝජනාව ගැන තර්කානුකූලව සිතා බලන ලෙසත්, තීන්ත ආලේප කිරීමේ යෝජනාව කල්දැමීම සුදුසු බවත්, එසේ නොමැති නම් යෝජනා වෙනස් කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී. 2025 වර්ෂයේ අනුමත කරගත් යෝජනාවේ නොපැවති අයිතමයනක් මෙහි ඇතුළත් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. තවද, මෙම යෝජනාව ඉදිරිපත් කිරීමේදී ඒ පිළිබඳව ද දැනුවත් කිරීම සිදුකළ යුතුව තිබූ බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මතභේදාත්මක කරුණක් වූ බැවින් රීති ගැන නොසලකා සිටි බවත්, නමුත් රීති තවතවත් උල්ලංඝනය කිරීමට ඉඩ දිය නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී. කිසිදු ව්‍යාපෘතියක් සම්බන්ධ තොරතුරු සැඟවීමේ කිසිදු අවශ්‍යතාවයක් තමාට නොමැති බවත්, ඕනෑම යෝජනාවක් සම්බන්ධ තොරතුරු අදාළ විෂය නිලධාරිගෙන් ලබා ගැනීමේ හැකියාව පවතින බවත් ප්‍රකාශ කරන ලදී. තවද, මෙම යෝජනාව සම්බන්ධව මහසභාවේදී සාකච්ඡාවට භාජනය වන 03 වන අවස්ථාව මෙය බවත්, මෙය ක්‍රියාත්මක කිරීම කඩාකප්පල් කිරීමට කුමන්ත්‍රණය නොකරන ලෙස ඉල්ලා සිටින ලදී.

විශේෂයෙන්ම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමාගේ සංශෝධිත යෝජනාව ක්‍රියාත්මක කිරීමට තමා එකඟ බවත්, නමුත් දිට්වාව සඳහා ප්‍රතිපාදන ලැබෙමින් පවතින බැවින් සභා අරමුදල් ඒ සඳහා වැය කිරීමට අවශ්‍ය නොවන බවත්, දිට්වාවෙන් හානියට පත් වී සංවර්ධනය කළ යුතු කොට්ඨාශයේ ඉල්ලීම් පවතී නම් එම ඉල්ලීම් යෝජනා ලෙස ඉදිරිපත් කරන ලෙසත් දන්වා සිටින ලදී.
තවද, තමා ප්‍රාදේශීය සභාවේ සභාපති ලෙස සභා ගොඩනැගිල්ල විනාශ වී යන අයුරු බලා සිටිය නොහැකි බැවින් හා සභාගර්භය පිරිසිදු කිරීම සඳහා නිතර නිතර සේවකයින් යෙදවීමටද නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී. මෙම ගොඩනැගිල්ල මෙසේ සිදු වී ඇත්තේ නිසි සැලැස්මකට අනුව සකස් කර නොමැති බැවින් බවත්, මෙම ස්ථානය සභාගර්භය නොවන බවත්, මෙය රැස්වීම් ශාලාව බවත්, සභාගර්භය බිම් මහලේ පැවැති බවත්, එහි ඉඩකඩ ප්‍රමාණවත් නොවීම මත මෙම ස්ථානයට ගෙන ඇති බවත්, පසුගිය කාල වකවානුවලදී සභාගර්භයක් ස්ථාපිත කිරීමට කටයුතු සිදු කර නොමැති වීම කණගාටුදායක කරුණක් බවත් ප්‍රකාශ කරන ලදී. ඵලදායිතා තරඟාවලියට ඇඳුම් කර ඇති බවත්, ඉන් රඹුක්කන ප්‍රාදේශීය සභාව තෝරා ගෙන ඇති බවත්, එහිදී ආයතනික වශයෙන්, භෞතික වශයෙන් හා මානුෂික වශයෙන් දියුණුවක් ඇති කරගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

උපසභාපතිතුමන් ප්‍රකාශ කළ පරිදි අද මේ සභාව ඉවර වූ මොහොතේම සමාජ මාධ්‍ය ඔස්සේ ජනමාධ්‍ය ඔස්සේ ලොකු පොල් අකුරින් "රඹුක්කන ප්‍රාදේශීය සභාවේ සභා ගොඩනැගිල්ලේ බාහිර බිත්ති තීන්ත ආලේප කිරීමට ලක්ෂ 50 ට අධික මුදලක් වැය කිරීමට තීරණය කර ඇත " යන්න සටහන් වීම නතර කළ නොහැකි බවත් , යෝජනාව සංශෝධනය කිරීම සුදුසු බවත්, සභා ගොඩනැගිල්ල පිටුපස කොටස පිළිසකර කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

යෝජනාවෙන් පරිබාහිරව අදහස් දැක්වීමෙන් වළකින ලෙස ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

රට හෝ රටේ ආර්ථික අර්බුදයකට මුහුණ දී තිබුණද අපට හැකියාව පවතී නම් අපේ සංවර්ධන කටයුතු සිදුකර ගැනීම ගැටළු සහගත නොමැති බවත්, දැනට පවතින රජය විසින් මහනුවර අධිවේගී මාර්ගය සකස් කරමින් පවතින බවත් ප්‍රකාශ කරන ලදී. අර්බුදය සංවර්ධන කටයුතු නවතා දැමිය යුතු නැති බවත්, සභා අරමුදල් පවතී නම් සභාවට මෙම වියදම දැරීමට හැකියාව පවතී නම් හා ටෙන්ඩර් ක්‍රියාමාර්ග අනුගමනය කරමින් ඇස්තමේන්තුව අනුමත වී ඇත්නම් එහි කිසිදු ගැටළුවක් නොමැති නම් මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. යෝජනාවේ වගන්තියෙහි පවතින අඩුපාඩුව නිවැරදි කිරීම සුදුසු බැවින් උපසභාපතිතුමන් විසින් ප්‍රකාශිත අදහස යෝජනාවක් ලෙස ඉදිරිපත් කිරීමට මහසභා අනුමැතිය ලබාදීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. තවද, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර සිටීම මත මෙහි අගය තව තවත් ඉහළ යාමක් සිදුවන බවත්, ගොඩනැගිල්ලෙහි හානිය තව තවත් වැඩිවන බවත් ප්‍රකාශ කරන ලදී. අලුත් වැඩියා කිරීම් ඒ මොහොතේ සිදු කළ යුතු දෙයක් වන බවත්, වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. තවද, න්‍යාය පත්‍රයට යෝජනා ඉදිරිපත් කිරීමේදී ඒවා ලේකම්තුමාගේ හා සභාපතිතුමන්ගේ දැඩි අධීක්ෂණයට ලක් කිරීම ඉතා වටිනා බවත් ප්‍රකාශ කරන ලදී. එසේම අනවශ්‍ය ලෙස කාලය අපතේ යැවීම ගැන තමා පෞද්ගලික කණගාටු වන බවත් ප්‍රකාශ කරන ලදී.

සභාගර්භයේ ඝෝෂා, සභාපතිතුමන් විසින් එය සමථයකට පත්කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

අනවශ්‍ය ලෙස කාලයේ අපතේ යාම ගැන කණගාටුව ප්‍රකාශ කරන ලදී. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමන් අදහස් දැක්වූ පරිදි මේ මොහොතේත් පරවී අපද්‍රව්‍ය සභාගර්භය පුරා විහිදී යන ආකාර දැකිය හැකි බවත්, මෙම යෝජනාව ක්‍රියාත්මක කළ යුතු බවත්, හැකි නම් වායුසමනය කළ හැකි නම් එය ඉතා වටිනා බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

"රඹුක්කන ප්‍රාදේශීය සභා බාහිර බිත්ති තීන්ත ආලේප කිරීම සඳහා වන ඇස්තමේන්තුව" යන්න වෙනුවට "රඹුක්කන ප්‍රාදේශී සභා ගොඩනැගිල් ලේ සිවිලිම සකස් කිරීම හා අළුත්වැඩියා කටයුතු සහ බාහිර බිත්ති තීන්ත ආලේප කිරීම සඳහා වූ ඇස්තමේන්තුව" යන්න යෙදීම සුදුසු බවට යෝජනා කළ අතර,
එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

උපසභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද සංශෝධිත යෝජනාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධ බෙදීමක අවශ්‍යතාව පවතීද යන්න විමසන ලද අතර බෙදීමට අවශ්‍යතාවය පවති යන්න සභා ගර්භයෙන් ඉදිරිපත් වන බව ප්‍රකාශ කරන ලදී.

අනු අංකය	නම	යෝජනාවට පක්ෂව	යෝජනාවට විපක්ෂව	ඡන්දය දිමෙන් වැළකි සිටිම.	සභා ගර්භයේ නොසිටී	නොපැමිණි
01	ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා					
02	ඊ.ඩි.ඒ.එස්.කරුණාරත්ත මැතිතුමා	√				
03	වයි.ජී.ජයවීර මැතිතුමා	√				
04	ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා	√				
05	ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය	√				
06	පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා	√				
07	එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා				x	
08	එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා	√				
09	එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා	√				
10	කේ.සී.සරත් කුමාර මැතිතුමා	√				
11	එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා					x
12	ජේ.පී.පද්මසිරි මැතිතුමා	√				
13	එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා	√				
14	පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය					x
15	එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා					x
16	එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා	√				
17	ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා	√				
18	එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා	√				
19	එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා	√				
20	වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය					x
21	එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා		√			
22	ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා		√			
23	පී.ජී.මල්ලිකා මැතිතුමිය	√				
24	ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා	√				
25	එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා	√				
26	පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා	√				
27	එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා		√			
28	කේ.පී.එස්.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා	√				
29	වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා	√				
30	පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා	√				

31	එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය	√				
32	ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා		√			
33	ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය	√				
34	එම්.ආර්.එන්.එම්.ජයසුන්දර මැතිතුමිය					x
35	ඩී.එල්.සී.සිසිර කුමාර මැතිතුමා					x
36	ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා	√				
37	ඩබ්.ජී.කරුණාවතී මැතිතුමිය	√				
	එකතුව	**25**	**04**	**00**	**01**	**06**

ඒ අනුව රඹුක්කන ප්‍රාදේශී සභා ගොඩනැගිල්ලේ සිවිලිම සකස් කිරීම හා අළුත්වැඩියා කටයුතු සහ බාහිර බිත්ති තීන්ත ආලේප කිරීම සඳහා වූ ඇස්තමේන්තුව සම්බන්ධ සංශෝධිත යෝජනාව ක්‍රියාත්මක කිරීමට පක්ෂව ඡන්ද 25 ක් ද විපක්ෂව ඡන්ද 04 ක් ද නොපැමිණීම් 06 ක් ද සභාගර්භයේ නොසිටි 01 ක් ද වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී. ඒ අනුව වැඩි ඡන්ද 21 න් අදාළ යෝජනාව සභා සම්මත විය.

තීරණය -

2026 වර්ෂයේ නව මිල ගණන් (Rate) යටතේ සකස් කරන ලද රඹුක්කන ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ සිවිලිම සකස් කිරීම හා අලුත්වැඩියා කටයුතු සහ බාහිර බිත්ති තීන්ත ආලේප කිරීම සඳහා වූ ඇස්තමේන්තුගත වටිනාකම වන රු.5,260,000.00 ක සංශෝධිත යෝජනාව වැඩි ඡන්ද 21න් සභා සම්මත විය.

v. **(2026 වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට සකස් කළ ඇස්තමේන්තුව) 2026 වර්ෂයට අදාලව නව මිල (Rate) ඇතුලත් කර නැවත සකස් කළ ජාකොබ්වත්ත නිල නිවසේ පවතින අඩුපාඩු සකස් කිරීම (අදියර I) සඳහා වන රු.2,270,000.00ක ඇස්තමේන්තුව සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2025 වර්ෂයේ දී මීට අදාළ ඇස්තමේන්තුව අනුමත වුවද 2026 වර්ෂයේ නව මිල (Rate) අනුව ක්‍රියාත්මක කිරීමට සිදුවී ඇති බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

මේ යෝජනාවට තමා විරුද්ධ බව ප්‍රකාශ කරන ලදී. මහජන මුදලින් වියදම් දැරිය යුත්තේ මහජනතාවගේ සුභ සිද්ධිය උදෙසා බවත්, සභාව සතු තාක්ෂණ නිලධාරීන්ගේ සහයෝගය ලබාගෙන සැලසුම් සකස් කළ හැකි බවත්, මාර්ගයක් සකස් කරන විට මිනුම් කටයුතු සභාව විසින් සිදු කළ යුතු බවත් ආදී වශයෙන් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදාල යෝජනාවට පරිබාහිරව අදහස් දැක්වීමෙන් වළකින ලෙසත්, ඊළඟ සබාවාරයට යෝජනාවක් හැටියට අදාළ මාර්ග ඉදිරිපත් කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී. තවද, මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී. තෙන්නකෝන් මන්ත්‍රීතුමා අකමැති බව සටහන් කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී. මෙම ව්‍යාපෘතියට අදාළව මේ වන විට විගණන විමසුමක් මෙන්ම නඩු කටයුත්තක් පවතින බවත්, දැනට ලක්ෂ 40 ක් පමණ වියදම් කර ඇති මෙම ගොඩනැගිල්ල භාවිතයට නොගෙන තැබීම මහජන මුදල් අපතේ යැමක් බවත්, මෙය සංවර්ධනය කර ආදායම් උත්පාදනය සඳහා යෙදවිය හැකි බවත්, ඒ සඳහා ඉඩම් පරිහරණ කොමිසමට ලබාදීමට අනුමැතිය ලැබී ඇති බැවින් හැකි ඉක්මනින් සංවර්ධන කටයුතු සිදුකර ඔවුන්ට ලබා දිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී. තෙන්නකෝන් මන්ත්‍රීතුමා පුරුද්දක් ලෙස ඕනෑම යෝජනාවක් සාකච්ඡාවට භාජනය කිරීමට පෙරම විරුද්ධතාවය හෝ එකඟතාවය ප්‍රකාශ කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමාගේ මෙම ප්‍රකාශයට තමා ඇතුළු විපක්ෂය විරුද්ධ බවත්, මන්ත්‍රීවරයකු ඉල්ලක කර මෙසේ අදහස් ප්‍රකාශ කිරීම උචිත නොවන බවත්, යෝජනාවට අදාළව පමණක් අදහස් දක්වන ලෙසට අවවාද කරන ලෙස ඉල්ලා සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

යම් යෝජනාවක් ඉදිරිපත් කළ විට එහි ගැඹුර අධ්‍යයනය කළ යුතු බවත්, එනම් එමඟින් සභා අරමුදලට කුමක් සිදු වේ ද ක්‍රියාත්මක කිරීමෙන් අත්වන වාසිය කුමක්ද නොකිරීමෙන් සිදුවන අවාසිය කුමක්ද විගණනය තුඩු දෙන කරුණක්ද විගණනයක් පවතීද යන්න පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමකින් තොරව වෙන වෙනම අදහස් ඉදිරිපත් කරමින් සභාවේ කාලය අපතේ යැවීම ගැන තමාගේ පෞද්ගලික විරෝධතාවය ප්‍රකාශ කරන බවත්, පක්ෂ හෝ විපක්ෂ ඕනෑම මන්ත්‍රීවරයකු යම් යෝජනාවකට අදහස් දැක්වීමේදී ඊට අදාළ තොරතුරු හා දත්ත ඇතිව අදහස් ප්‍රකාශ කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම ඵලදායිතාව පිළිබඳව අදහස් දැක්වීම ප්‍රමාණවත් බවත් විරුද්ධත්වයක් පවතී නම් එකහෙලාම විරුද්ධත්වය ප්‍රකාශ කිරීම සුදුසු බවත්, ඒ සඳහා අසීමාන්විතව අදහස් දැක්වීම මඟින් කාලය කළමනාකරණය කර ගැනීමේ අපහසුතාවයක් පවතින බවත් ප්‍රකාශ කරන ලදී. තවද, න්‍යාය පත්‍රය අතට ලැබුණු දින හෝ ඊට පසු දිනක සභාවට පැමිණ පවතින ගැටළු පිළිබඳව සභාපතිතුමන්, ලේකම්තුමන් හෝ විෂය නිලධාරීන් හමුවී විසඳුම් ලබා ගැනීම මඟින් මෙසේ අනවශ්‍ය ලෙස කාලය අපතේ යෑම වළක්වා ගත හැකි බවත් ප්‍රකාශ කරන ලදී. විශේෂයෙන්ම සභාව ගව මඩුවක් ලෙස පත්කර නොගෙන ගෞරවාන්විතව තැනක් කරගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

යම් යෝජනාවකට අදහස් දැක්වීමේදී මතභේදාත්මක ලෙස කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා නොදෙන ලෙසට ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් විසින් යෝජනා කරන බවත්, නමුත් මහජන මුදල් වියදම් කිරීමේදී ඊට නීති දෙකක් තිබිය නොහැකි බවත් , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී. තෙන්නකෝන් මැතිතුමා දිගින් දිගටම සභාවට පැහැදිලි කිරීමට උත්සාහ දැරුවේ මාර්ගයක් සභාවට පවරා දුන් පසු එය සභා දේපළක් බවත්, එහි මිනුම් කටයුතු සභා අරමුදලින් දැරීමට එකඟවී ඇති බැවින් එය එසේ සිදුවූවා නම් එතුමා මෙම ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමට විරුද්ධව අදහස් දැක්වීමක් සිදු නොකරනු ඇතැයි තමා විශ්වාස කරන බවත් ප්‍රකාශ කරන ලදී. විශේෂයෙන්ම මෙම ගොඩනැගිල්ල එදා සභාවේදී රථ වාහන අංගනයක් ඉදි කිරීම සඳහා අනුමැතිය ලබාගත් යෝජනාවක් බවත්, හොඳ සංවර්ධන ව්‍යාපෘති සඳහා දේශපාලන කුහකත්වයක් නොමැතිව විපක්ෂ මන්ත්‍රීවරුන් ලෙස අද මෙන්ම එදාත් සහයෝගය ලබාදුන් බවත්, වර්තමානයේ දී විපක්ෂ මන්ත්‍රීවරුනට කිසිදු වරප්‍රසාදයක් නොලැබුණද ඵලදායී යෝජනා සඳහා අනුමැතිය ලබා දී ඇති බව ප්‍රකාශ කරන ලදී.

තවද, කාර්යාල පරිශ්‍රයේදී අදහස් දැක්වීමකින් ඵලක් නොමැති බවත්, සභා රැස්වීමේදී අදහස් දක්වා තීරණයක් ගැනීම කාලෝචිත බවත්, මෙම යෝජනාව අනුව සභාපතිතුමන් විසින් මෙම ගොඩනැගිල්ල බදු දීමට සැලසුම් කර ඇති බවට ප්‍රකාශ කළ නමුත් යෝජනාවෙහි එවැන්නක් අන්තර්ගත නොවීම ගැටළු සහගත බවත් ප්‍රකාශ කරන ලදී. කාලය කළමනාකරණය කරගත යුතු බැවින් අදහස් දැක්වීම සීමා කිරීමට යාම සම්බන්ධව කණගාටුව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සභා කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධව රීති මාලාවක් පවතින බවත්, එම රීති මාලාවට අනුව කටයුතු සිදුවේද යන්න අධීක්ෂණය කිරීමට අධීක්ෂණ මණ්ඩලයක් සිටින බවත්, අධිකරණ කටයුත්තකදී ප්‍රබල සාක්ෂියක් ලෙස සභාවාර්තාව යොදාගන්නා බවත් ප්‍රකාශ කරන ලදී. විශේෂයෙන්ම අධීක්ෂණ මණ්ඩලය විසින් අපට පෙන්වා දෙන අඩුපාඩු අප නිවැරදි කර නොගතහොත් සභාවක් හැටියට අප අසාර්ථක වන බැවින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමන් එවැනි අදහසක් ඉදිරිපත් කිරීමට හේතුව බවත් ප්‍රකාශ කරන ලදී. ඒ වගේම මෙම ගොඩනැගිල්ල බදු දෙන නොදෙන එක තවම සභාව තීරණය කර නොමැති බවත්, බදු දීමට කැමැත්ත විමසා ලිපියක් ලැබී ඇති බැවින් බදු දීමට අදහස් කරන බව ප්‍රකාශ කළ බවත් දන්වන ලදී.

පෙ.ව 11.18 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා ඉවත්ව යන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

වසර 35 ක් පමණ දේශපාලන අත්දැකීම් තමාට ඇති බවත්, මහජනතාවගේ ඡන්දයෙන් පත්වූ මහජන නියෝජිතයකු වන අපට මහජනතාවගේ මුදල් වියදම් කිරීම සම්බන්ධව සොයා බැලීමට අයිතියක් පවතින බවත්, එසේම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා එදා රු.10.00 ගමන් වියදම් දීමනාව රු.100.00 දක්වා වැඩි කර ගැනීමට යෝජනාවක් ඉදිරිපත් කළ නමුත් විපක්ෂ මන්ත්‍රීවරයකුගේ යෝජනාවක් බැවින් ඒ සඳහා පක්ෂ මන්ත්‍රීවරු විරුද්ධත්වය ප්‍රකාශ කළ බවත් ප්‍රකාශ කරන ලදී. මාර්ගයක් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය ,

- ඉඩම් හිමියාගෙන් කැමැත්ත ඉල්ලීම.
- මිනින්දෝරුවකු යොදවා මිනුම් කටයුතු සිදුකිරීම.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මාතෘකාවෙන් පිට අදහස් දැක්වීමෙන් වළකින ලෙස දන්වන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

මහජනතාවගේ මුදලින් මහජන අවශ්‍යතා ඉටු කිරීමට යාමේදී අදාළ සංවර්ධන කටයුත්තට අදළ වියදම් මහජනතාවට දැරිය යුතු වීම හා මහජන මුදල් විශාල වශයෙන් මෙසේ වියදම් කිරීමට යෙදවීම අනුමත කළ නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී. සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටින බවත්, අයුක්තිය අසාධාරණය වෙනුවෙන් කවදත් හඬ අවදිකරන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සම්බන්ධව බෙදීමකට යාමේ අවශ්‍යතාව පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාව පවතී යන්න සභාගර්භයෙන් ඉදිරිපත් වන බව ප්‍රකාශ කරන ලදී.

අනු අංකය	නම	යෝජනාවට පක්ෂව	යෝජනාවට විපක්ෂව	ඡන්දය දීමෙන් වැළකී සිටීම.	සභා ගර්භයේ නොසිටී	නොපැමිණි
01	ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා					
02	ටී.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා	√				
03	වයි.ජී.ජයවීර මැතිතුමා	√				
04	ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා	√				
05	ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය	√				

06	පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා	√				
07	එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා				x	
08	එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා	√				
09	එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා	√				
10	කේ.සී.සරත් කුමාර මැතිතුමා	√				
11	එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා					x
12	ජේ.පී.පද්මසිරි මැතිතුමා	√				
13	එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා	√				
14	පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය					x
15	එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා					x
16	එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා	√				
17	ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා				x	
18	එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා	√				
19	එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා	√				
20	වී.ආර්.ටී.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය					x
21	එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා		√			
22	ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා		√			
23	පී.ජී.මල්ලිකා මැතිතුමිය		√			
24	ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා				x	
25	එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා			√		
26	පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා			√		
27	එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා		√			
28	කේ.පී.එස්.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා			√		
29	වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා			√		
30	පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා			√		
31	එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය			√		
32	ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා		√			
33	ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය			√		
34	එම්.ආර්.එන්.එම්.ජයසුන්දර මැතිතුමිය					x
35	ඩී.එල්.සී.සිසිර කුමාර මැතිතුමා					x
36	ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා			√		
37	ඩබ්.ජී.කරුණාවතී මැතිතුමිය			√		
	එකතුව	**13**	**05**	**09**	**03**	**06**

ඒ අනුව 2026 වර්ෂයට අදාළව නව මිල(Rate) ඇතුළත් කර නැවත සකස් කළ ජාකොබ්වත්ත නිල නිවසේ පවතින අඩුපාඩු සකස් කිරීම (අදියර I) සඳහා වන රු2,270.000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීමට වූ යෝජනාවට පක්ෂව ඡන්ද 13 ක් ද විපක්ෂව ඡන්ද 05 ක් ද වැළකීම් 09 ක් ද නොපැමිණීම් 06 ක් ද හා සභා ගර්භයේ නොසිටීම 03 ක් ද වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී.ඒ අනුව වැඩි ඡන්ද 08 න් අදාළ යෝජනාව සභා සම්මත විය.

තීරණය -
2026 වර්ෂයට අදාළ නව මිල ගණන් (Rate) ඇතුළත් කර සකස් කරන ලද ජාකොබ්වත්ත නිල නිවසේ පවතින අඩුපාඩු සකස් කිරීම (අදියර I) සඳහා වන රු. 2,270,000.00 ක් වටිනා ඇස්තමේන්තුව ගත යෝජනාව වැඩි ඡන්ද 08 න් සභා සම්මත විය.

අවසානය
අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනිමට සහය ලබා දුන් ආණ්ඩුපක්ෂයේ ගරු උපසභාපතිතුමා ප්‍රමුඛ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්, ගරු මන්ත්‍රීවරියන්ටත් සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, මාධ්‍යවේදීන්ටත් ස්තූතිය පුද කරමින් සභාවේ වැඩ කටයුතු පෙ:ව: 11.30 පමණ අවසන් කරන ලදි.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශිය සභාව.

සංශෝධන
❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
පිටු අංක 02 හි තමා විසින් ප්‍රකාශ කරන ලද රට දැය වෙනුවෙන් දිවිදුන් හා ආබාධිත වූ රණවිරුවන්හට විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ ප්‍රණාමය පුද කරන බව පැවසුවද එය එම ප්‍රකාශයෙහි ඇතුළත් වී නොමැති බව සංශෝධනය යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**
පිටු අංක 08 හි ගරු උපසභාපතිතුමන් විසින් දැක්වූ අදහසෙහි රුපියල් මිලියන 32 ව්‍යාපෘතිය රුපියල් මිලියන 52 වැනි අගයක් දක්වා වැඩි වී ඇති බවත්, මෙහි කොලේ වසා ගැසීමක් සිදුවී ඇති බව ප්‍රකාශ වුවද එය වාර්තාගත වී නොමැති බවත්, ඒ අදහස හා තමා එකඟ වූ බවත්, පිරිමි හැටියට කොන්ද කෙලින් තියන් වැඩ කළ යුතු බවත්, තමා යුක්තිය වෙනුවෙන් කතා කරන බවත් ප්‍රකාශ කළද එය වාර්තාවේ ඇතුළත් නොවන බව සංශෝධනය යටතේ ප්‍රකාශ කරන ලදී.

2026.05.19 දින විශේෂ මහසභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත විය.

සත්‍ය පිටපතකි.

ආර්.එම්.එස්.බී.රත්නායක
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.